11622

OL/2024(2025)/87/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II**
தொடர்பாடலும் ஊடகக்கற்கையும் I, II
Communication and Media Studies I, II

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අන්තර් පුද්ගල සන්නිවේදන අවස්ථාවකට නිදසුනක් වන්නේ,
(1) චිත්‍ර ඇඳීමයි. (2) දුරකථන සංවාදයක යෙදීමයි.
(3) දේශනයක් පැවැත්වීමයි. (4) ප්‍රවෘත්ති ප්‍රචාරයක් සිදු කිරීමයි.

**2.** රාජ්‍ය තොරතුරු ගල් කණු මත කොටා තබන්නේ නම්, ඒවා
(1) ලෙන් ලිපි වේ. (2) ටැම් ලිපි වේ.
(3) සන්නස් වේ. (4) සෙල්ලිපි වේ.

**3.** ජොහැන්නස් ගුටෙන්බර්ග්ගේ දායකත්වය ඇතිව මුද්‍රණය වූ ග්‍රන්ථ ලෙස සැලකෙන්නේ,
(1) වජ්‍ර සූත්‍රය සහ ලතින් බයිබලයයි.
(2) ලතින් ව්‍යාකරණය සහ ලතින් බයිබලයයි.
(3) ලන්සි යාඥා පොත සහ වජ්‍ර සූත්‍රයයි.
(4) ලතින් බයිබලය සහ ලන්සි යාඥා පොතයි.

**4.** ශ්‍රී ලංකාවේ පළමු රූපවාහිනී සේවය ආරම්භ කර ඇත්තේ පෞද්ගලික සමාගමක් ලෙසයි. එය කුමක් ද?
(1) ජාතික රූපවාහිනිය (2) සිරස රූපවාහිනිය
(3) ස්වාධීන රූපවාහිනිය (4) දෙරණ රූපවාහිනිය

**5.** මහනුවර බලායාමේ අපේක්ෂාවෙන් කොටුව දුම්රියපොළට කඩිමුඩියේ පැමිණි රවී, ඝෝෂාව මධ්‍යයේ දුම්රිය නිවේදනය අසා මහව දුම්රියට නැග තිබුණි. රවීට අත්විඳීමට සිදු වූ සන්නිවේදන බාධාව කුමක් ද?
(1) සංජානන බාධාවකි (2) අර්ථ බාධාවකි
(3) සාමාජීය බාධාවකි (4) මාධ්‍ය බාධාවකි

**6.** තොරතුරු යනු
(1) නිවැරදි දත්ත සමූහයකි. (2) ගුණාත්මක දත්ත සමූහයකි.
(3) සකස් කළ දත්ත සමූහයකි. (4) ප්‍රයෝජනවත් දත්ත සමූහයකි.

**7.** ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් පළමු ඉංග්‍රීසි, දමිළ හා සිංහල පුවත්පත්වල අනුපිළිවෙළ කුමක් ද?
(1) කලම්බු ජර්නල්, උදය තාරකායි සහ ලංකාලෝකය
(2) කලම්බු ජර්නල්, උදය තාරකායි සහ ලක්මිණි පහන
(3) ද නේෂන්, තිනකරන් සහ ලක්මිණි පහන
(4) ඩේලි නිවුස්, උදය තාරකායි සහ ලංකාලෝකය

[දෙවැනි පිටුව බලන්න.

8. පුවත්පතක් සඳහා වූ ප්‍රවෘත්ති වාර්තාකරණ ශිල්පක්‍රම අතර වඩාත් ඉහළ වටිනාකමක් පෙන්නුම් කරන්නේ,
(1) ඡායාරූපයයි. (2) තීරු ලිපියයි.
(3) විශේෂාංගයයි. (4) යටිකුරු පිරිමීඩයයි.

9. ජනමාධ්‍ය හා සම්බන්ධ දොරටු පාලනය
(1) විවිධ වාර ගණනාවක් තුළ සිදුවන්නකි. (2) අභ්‍යන්තරික වශයෙන් පමණක් සිදුවන්නකි.
(3) කිසියම් මණ්ඩලයක් මගින් සිදුවන්නකි. (4) බාහිර මට්ටමින් පමණක් සිදුවන්නකි.

10. අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා භාවිත කළ **නොහැක්කේ** මින් කුමක් ද?
(1) කෙටි පණිවිඩ සේවාව (2) දුරකතන සංවාදය
(3) පුවත්පත් දැන්වීම (4) ව්‍යාපාරික ලිපිය

11. ගුවන්විදුලියෙහි පැරණිතම වැඩසටහන් ආකෘතිය වන්නේ,
(1) කථා ය. (2) සාකච්ඡා ය.
(3) සංවාද ය. (4) සම්මුඛ සාකච්ඡා ය.

12. බස් රථයේ ඝෝෂාකාරී සංගීතය නිසා දැඩි අපහසුතාවකින් තමරා ගමන් කළේ, කොයි මොහොතේ එයින් බැස ගන්නේ දැයි සිතමිනි. මෙම අවස්ථාව කුමන සන්නිවේදන වර්ගයකට අයත් වන්නේ ද?
(1) අන්තර් පුද්ගල සන්නිවේදනයට (2) ජනසන්නිවේදනයට
(3) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට (4) සමූහ සන්නිවේදනයට

13. ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රභේද දෙක කුමක් ද?
(1) දෘඪ පුවත් හා මෘදු පුවත් (2) දේශීය පුවත් හා විදේශීය පුවත්
(3) ජාතික පුවත් හා ප්‍රාදේශීය පුවත් (4) සංවර්ධන පුවත් හා ව්‍යාපාරික පුවත්

14. පුවත්පත් වර්ගීකරණයේ දී සලකා බැලිය හැකි ලක්ෂණ වන්නේ,
(1) පුවත්පතේ ප්‍රමාණය, ප්‍රකාශිත වාරය හා ආර්ථික සාධක වේ.
(2) භාවිත කරන පාඨකයා, ආර්ථික සාධක හා කේන්ද්‍රීය විෂයය වේ.
(3) භාවිත තාක්ෂණය, ප්‍රකාශිත වාරය හා කේන්ද්‍රීය විෂයය වේ.
(4) ප්‍රකාශිත වාරය, කේන්ද්‍රීය විෂයය හා භාවිත කරන පාඨකයා වේ.

15. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ඵලදායීතාව ඉහළ නංවාගැනීමට යොදාගත හැකි වඩාත් සාර්ථක සන්නිවේදන ස්වරූප දෙක ඇතුළත් වරණය කුමක් ද?
(1) වාචික හා ශ්‍රව්‍ය සන්නිවේදනය (2) අවාචික හා දෘශ්‍ය සන්නිවේදනය
(3) වාචික හා අවාචික සන්නිවේදනය (4) ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය

16. සන්නිවේදනය නිර්මාණාත්මක ව සිදු කිරීමට දෘශ්‍ය ප්‍රකාශන විධි බහුලව භාවිත කෙරේ. එවැනි දෘශ්‍ය ප්‍රකාශන විධි ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.
(1) අකුරු, අභිනය, සංඥා, චිත්‍ර (2) ඡායාරූප, ශබ්ද, ප්‍රස්තාර, සංඥා
(3) අභිනය, කවි, චිත්‍ර, සංකේත (4) ප්‍රස්තාර, කවි, චිත්‍ර, ඡායාරූප

17. ජනමාධ්‍ය යනු කර්මාන්තයකි. එහි මූලික අරමුණ වන්නේ,
(1) ග්‍රාහක අවශ්‍යතා හැකි පමණ සපුරාලීමයි.
(2) වැඩි ලාභයක් ලබාගැනීමට කටයුතු කිරීමයි.
(3) ගුණාත්මකබවින් ඉහළ තාක්ෂණික මෙවලම් භාවිතයයි.
(4) වෙළෙඳපල තරගකාරිත්වයට මුහුණදීමට සූදානම්ව සිටීමයි.

18. එක් අයකු කේන්ද්‍ර කරගනිමින් බොහෝදෙනාට සංදේශ පැතිරී යන විධිමත් සන්නිවේදන ආකෘතිය වන්නේ,
(1) වයි ආකෘතියයි. (2) දාම ආකෘතියයි.
(3) රෝද ආකෘතියයි. (4) චක්‍රීය ආකෘතියයි.

[තුන්වැනි පිටුව බලන්න.

**19.** හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදනය පිළිබඳ නිර්වචනයට අනුව සන්නිවේදන ක්‍රියාවලියේ අවසාන ඉලක්කය වන්නේ,
(1) ප්‍රශස්ත නාලිකා භාවිතයයි.
(2) අපේක්ෂිත වෙනස සිදු කිරීමයි.
(3) සන්නිවේදකයාගේ භූමිකාවේ පරිපූර්ණත්වයයි.
(4) ග්‍රාහක අත්දැකීම් පසුතලයට සරිලන සන්දේශයක් ඉදිරිපත් කිරීමයි.


**20.** විවිධ මාධ්‍ය ගණනාවක් එකට එකතු වීම දැකිය හැකි වන්නේ,
(1) අභිසාරිතාවේ දී ය. (2) ජනසන්නිවේදනයේ දී ය.
(3) ඩිජිටල්කරණයේ දී ය. (4) අව්‍යිමත් සන්නිවේදනයේ දී ය.

**21.** ඡායාරූපයක් ගැනීමේ ප්‍රධාන පියවර තුන වන්නේ පිළිවෙළින්
(1) මානනය, නාභිගත කිරීම හා අනාවරණයයි.
(2) අනාවරණය, මානනය හා නාභිගත කිරීමයි.
(3) නාභිගත කිරීම, අනාවරණය හා මානනයයි.
(4) නාභිගත කිරීම, මානනය හා අනාවරණයයි.

**22.** පහත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කරන්න.
A : ඇක්ටා ඩියුර්නා මුල් කාලීන එංගලන්ත පුවත්පතකි.
B : ලක්මිණි පහන ලංකාවේ ප්‍රථම සිංහල පුවත්පතයි.
C : මාසික තැග්ග ක්‍රිස්තියානි සම්භවයක් සහිත සඟරාවකි.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A පමණක් නිවැරදි ය. (2) B පමණක් නිවැරදි ය.
(3) C පමණක් නිවැරදි ය. (4) B හා C පමණක් නිවැරදි ය.

**23.** නිදහස් මාධ්‍යවේදියකු ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) තමන්ගේ ම මාධ්‍ය ආයතනයක් පවත්වාගෙන යන්නකු ය.
(2) විවිධ ආයතනවලට තොරතුරු සපයන මාධ්‍යවේදියකු ය.
(3) ආයතනයක් තුළ නිදහස උපරිමයෙන් භාවිත කරන මාධ්‍යවේදියකු ය.
(4) ආයතනයකට සම්බන්ධ වී තොරතුරු වාර්තාකරණයේ යෙදෙන මාධ්‍යවේදියකු ය.

**24.** මෙම රූපයෙන් දැක්වෙන්නේ,
(1) අන්තර් ක්‍රියාකාරී පුවරුවකි.
(2) සුදු ලෑල්ලකි.
(3) පිටු පෙරළනයකි.
(4) චුම්බක පුවරුවකි.



**25.** බුද්ධිමය දේපළ පනතට අනුව කිසියම් කෘතියක අයිතිය විකිණීමට, බදුදීමට හෝ කුලියට දීමට එහි කර්තෘට ඇත්තේ,
(1) සදාචාරාත්මක අයිතිවාසිකමකි. (2) නිර්මාණාත්මක අයිතිවාසිකමකි.
(3) ආර්ථික අයිතිවාසිකමකි. (4) වෘත්තීය අයිතිවාසිකමකි.

**26.** නිශ්චල ඡායාරූපයක් යනු,
(1) දර්ශනයක් රූ ගත කිරීමකි. (2) දර්ශනයක් සටහන් කර ගැනීමකි.
(3) දර්ශනයක් ප්‍රතිනිර්මාණය කිරීමකි. (4) දර්ශනයක එක් නිමේෂයක් සටහන් කර ගැනීමකි.

**27.** නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සන්දේශය හරිහැටි ශ්‍රවණය කර ගත නොහැකි වීම අර්ථ බාධකයකි.
(2) සන්දේශයක යටි පෙළ කියවා ගත නොහැකි වීම මාධ්‍ය බාධකයකි.
(3) සන්දේශයක අන්තර්ගත අර්ථ බාධක මාධ්‍ය බාධකවලට වඩා ප්‍රබල වේ.
(4) සන්දේශයක භාවිත කර ඇති සංකේත අවබෝධ කර ගැනීමේ නොහැකියාව අර්ථ සහ මාධ්‍ය බාධකවලට හේතු වේ.

**28.** අත්දැකීම් පසුතලය පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) අත්දැකීම් පසුතලය විටින් විට වෙනස් වේ.
(2) සන්දේශ සම්ප්‍රේෂණයේ දී අත්දැකීම් පසුතලය වැදගත් වේ.
(3) ජනමාධ්‍ය ග්‍රාහක ක්ෂේත්‍රය සමජාතීය අත්දැකීම් පසුතල නියෝජනය කරයි.
(4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ දී අත්දැකීම් පසුතලය පිළිබඳ ඉහළ අවධානයක් යොමු වේ.

**29.** "මාධ්‍ය ආයතනයක වියදම පියවා ගැනීම ග්‍රාහකයා මගින් පමණක් සිදු කළ නොහැක." මෙම ප්‍රකාශයෙන් අදහස් කෙරෙනුයේ,
(1) දැන්වීම් මගින් ආදායම් රැස් කර ගත යුතු බව ය.
(2) ග්‍රාහකයා මාධ්‍ය භාවිතයට ගෙවනු ලබන ගාස්තු වැඩි කළ යුතු බව ය.
(3) මාධ්‍ය ආයතන සිය ග්‍රාහක සංඛ්‍යාව පුළුල් කර ගැනීමට කටයුතු කළ යුතු බව ය.
(4) නඩත්තු, තාක්ෂණික උපකරණ වැනි ප්‍රාග්ධන වියදම් අඩු කළ යුතු බව ය.

**30.** බ්‍රෝඩ් ෂීට් පුවත්පත් පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඒවා බොහෝ විට සරල හා ආකර්ෂණීය ආකෘතිවලින් යුක්ත ය.
(2) මෘදු පුවත් බහුලව දක්නට ලැබෙන්නේ මෙම පුවත්පත්වල ය.
(3) ජාතික මට්ටමේ පුවත්පත් බොහොමයක් මෙම ප්‍රමාණයෙන් යුක්ත වේ.
(4) සීමිත පිරිසක් ඉලක්ක කරගත් පුවත්පත් ආකෘතියකි.

**31.** පහත අවස්ථා සලකන්න.
A : සම්මුඛ සාකච්ඡා
B : නිසදැස්
C : සම්මන්ත්‍රණ
ඉහත අවස්ථාවන්ට අදාළ සන්නිවේදන වර්ග අනුපිළිවෙළ වන්නේ,
(1) අන්තර්වර්තී පුද්ගල, අන්තර් පුද්ගල හා සමූහයි.
(2) අන්තර් පුද්ගල, අන්තර්වර්තී පුද්ගල හා සමූහයි.
(3) සමූහ, අන්තර්වර්තී පුද්ගල හා අන්තර් පුද්ගලයි.
(4) අන්තර් පුද්ගල, සමූහ හා අන්තර්වර්තී පුද්ගලයි.

**32.** මානව හිමිකම් හා වගකීම් අයත් වන්නේ කුමන ජනමාධ්‍ය නියෝජන අධ්‍යයනයකට ද?
(1) සමාජීය නියෝජන අධ්‍යයනයට ය.
(2) ආර්ථික නියෝජන අධ්‍යයනයට ය.
(3) සෞන්දර්යාත්මක නියෝජන අධ්‍යයනයට ය.
(4) ආගමික හා සදාචාරාත්මක නියෝජන අධ්‍යයනයට ය.

**33.** විධිමත් සන්නිවේදනයට අයත් **නොවන** වරණය තෝරන්න.
(1) ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් සන්නිවේදනය සිදු වේ.
(2) ආයතනයක සමාන්තර කාර්ය මණ්ඩල අතර තොරතුරු හුවමාරු වේ.
(3) තනි දාමය, දාම ආකෘතිය හා පර්ෂද දාමයට අනුව සන්නිවේදනය සිදු වේ.
(4) සංවිධානයේ ප්‍රධානියාගේ අධිකාරි බලය යටතේ සන්නිවේදනය විධිමත් ව ක්‍රියාත්මක වේ.

**34.** අනාවරණය කරන ලද පටල පටයක් රසායනික ක්‍රියාවකට බඳුන් කළ පසු රූපයක් මතු කර ගැනීම හඳුන්වන්නේ,
(1) මානනය ලෙස ය.
(2) පැසරුම්කරණය ලෙස ය.
(3) විභේදනය ලෙස ය.
(4) ඩිජිටල්කරණය ලෙස ය.

**35.** සිංහරාජ වනාන්තරය පිළිබඳ රූපවාහිනී මාධ්‍ය නිර්මාණයක දී වඩා උචිත වැඩසටහන් ප්‍රභේද වන්නේ,
(1) ඒකාංගික ටෙලිනාට්‍යයක්, සඟරාමය වැඩසටහනක් හා ප්‍රවෘත්ති ය.
(2) සජීවී වැඩසටහනක්, වාර්තා වැඩසටහනක් හා ප්‍රවෘත්ති ය.
(3) සඟරාමය වැඩසටහනක්, වාර්තා වැඩසටහනක් හා ප්‍රවෘත්ති ය.
(4) සඟරාමය වැඩසටහනක්, සජීවී වැඩසටහනක් හා වාර්තා වැඩසටහනක් ය.

[පස්වැනි පිටුව බලන්න.

**36.** අන්තර්ජාලයෙහි පමණක් පළ කෙරෙන මාර්ගගත පුවත්පතක් (online newspaper) විද්‍යුත් පුවත්පතකින් (e-newspaper) වෙනස් වන්නේ, එය

(1) ලොව ඕනෑම තැනක සිට කියවිය හැකි බැවිනි.
(2) දවසේ ඕනෑම වේලාවක ඊට ප්‍රවේශ විය හැකි බැවිනි.
(3) අඩු පිරිවැයකින් ප්‍රකාශනය කළ හැකි බැවිනි.
(4) නිතර යාවත්කාලීන කිරීමේ හැකියාවක් ඇති බැවිනි.

**37.** මාධ්‍ය ආයතනයක රඳා පැවැත්ම තීරණය කරන ප්‍රධාන සාධක යුගලය කුමක් ද?

(1) ග්‍රාහකයා සහ ව්‍යාපාරික අනුග්‍රහය
(2) ග්‍රාහකයා සහ වැඩසටහන්
(3) ව්‍යාපාරික අනුග්‍රහය සහ හිමිකාරිත්වය
(4) ව්‍යාපාරික අනුග්‍රහය සහ වැඩසටහන්

**38.** රූපවාහිනිය අස්ථායී මාධ්‍යයක් ලෙස හඳුන්වන්නේ,

(1) එහි වැඩසටහන් වර්ග නිතර වෙනස් වන හෙයිනි.
(2) එම මාධ්‍යයෙහි ජංගමශීලීත්වයක් දක්නට නොමැති හෙයිනි.
(3) පුවත්පතක මෙන් එකම තොරතුරු සමූහයකට සීමා නොවන හෙයිනි.
(4) එමගින් විසුරුවා හරින සන්දේශ එසැණින් ග්‍රහණය කර ගත යුතු හෙයිනි.

**39.** ගුවන්විදුලි සඟරාමය වැඩසටහනක් යනු,

(1) සිද්ධියක් වූ අවස්ථාවක ඇති සැබෑ සම්බන්ධතා සහ කතා ඇසුරින් සකස් වන්නකි.
(2) එක් විෂයයක් හෝ විෂය කරුණක් පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණවලින් බලා නිර්මාණය කෙරෙන්නකි.
(3) සත්‍ය සිදුවීම් හා පුද්ගල ආශ්‍රිත තොරතුරු පාදක කොට ගෙන ගොඩනැගෙන්නකි.
(4) කෙටි විශේෂාංග, ප්‍රවෘත්තිමය තොරතුරු, සම්මුඛ සාකච්ඡා වැනි වෙනස් ආකෘතිවලට අයත් අංග ඇතුළත් වූවකි.

**40.** ශ්‍රව්‍ය සන්නිවේදනය සම්බන්ධයෙන් අදහස් කිහිපයක් පහත දැක්වේ.

A : හඬ පාදක කරගනිමින් සිදු වේ.
B : මිනිස් හඬ, සත්ත්ව හඬ, කෘත්‍රිම හඬ ඇතුළත් වේ.
C : නූතන ශබ්ද ප්‍රභේද පමණක් ඇතුළත් වේ.
D : නිහඬතාව ශ්‍රව්‍ය සන්නිවේදනයේ අංගයකි.

ඉහත අදහස් අතුරෙන්,

(1) A, B හා C සත්‍ය වේ.
(2) A, B හා D සත්‍ය වේ.
(3) B, C හා D සත්‍ය වේ.
(4) A, B, C හා D යන සියල්ල සත්‍ය වේ.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II**
தொடர்பாடலும் ஊடகக்கற்கையும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** තොරතුරු හුවමාරුව සන්නිවේදන ක්‍රියාවලියේ මූලික කාර්යයයි.

(i) මිනිසාට තොරතුරු වැදගත් වන ප්‍රධාන අවස්ථා **දෙකක්** නම් කරන්න.

(ii) තොරතුරු මගින් ඉටු කෙරෙන සමාජ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ පුරාතන යුගයෙහි තොරතුරු ලබා දීම සඳහා භාවිත කළ විධික්‍රම **දෙකක්** ලියන්න.

(iv) තොරතුරු රැස් කරන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග **දෙකක්** නම් කරන්න.

(v) ප්‍රධාන සන්නිවේදන වර්ග **දෙකක්** ලියන්න.

(vi) තොරතුරු සම්ප්‍රේෂණ මෙවලමක් වන ගුවන්විදුලියේ නිර්මාතෘවරයා කවුද?

(vii) සන්නිවේදනය පිළිබඳ ෂැනන් සහ වීවර් ගේ නිර්වචනය ලියන්න.

(viii) විධිමත් සන්නිවේදනයේ දී දැකිය හැකි සන්නිවේදන ආකෘති **දෙකක්** සඳහන් කරන්න.

(ix) නූතන තොරතුරු සන්නිවේදනයේ දී වැදගත් වන පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.

(x) නිර්මාණාත්මක සන්නිවේදනයෙහි ලා භාවිත සිනමා මාධ්‍ය හා සම්බන්ධ 'දෘෂ්ටියේ අඛණ්ඩතාව' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

**2.** පාසල් වර්ණ ප්‍රදානෝත්සවයේ නිවේදන කටයුතු සඳහා රවී සහ කමලාගේ නම් යෝජනා විය.

(i) මෙම උත්සවයට පෙර රවී හා කමලා ඒ පිළිබඳව වාචික සන්නිවේදනයේ යෙදේ. වාචික සන්නිවේදනය යනු කුමක් ද?

(ii) වාචික සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා අවධානය යොමු කළ යුතු භාෂාව සම්බන්ධ අංග **දෙකක්** පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

(iii) සමූහ සන්නිවේදනයේ විශේෂතා **තුනක්** ඉහත උත්සව අවස්ථාව ඇසුරෙන් විස්තර කරන්න.

(iv) මෙම උත්සවය පටිගත කළ වැඩසටහනක් ලෙස ගුවන්විදුලි මාධ්‍ය තුළ ප්‍රචාරය විය. ගුවන්විදුලි මාධ්‍යයේ ලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

[අත්වැනි පිටුව බලන්න.

**3.** විවිධ මාධ්‍ය මගින් සිදු කරන තොරතුරු විසරණ ක්‍රියාවලිය සංකීර්ණ වූවකි.

(i) බහුල ලෙස යොදා ගනු ලබන තොරතුරු වාර්තාකරණ ක්‍රම **දෙක** නම් කරන්න.

(ii) පුවත්පත් වාර්තාකරණයේ දී 'පෙළ' සහ 'රූපය' යන්නට අයත් වන අංග **දෙක** බැගින් වෙන වෙන ම සඳහන් කරන්න.

(iii) ගුවන්විදුලි පිටපත් රචනයේ දී සැලකිලිමත් වන පහත සාධකවල සුවිශේෂතා වෙන වෙන ම පැහැදිලි කරන්න.

(අ) භාෂාවේ ස්වරූපය (ආ) ආමන්ත්‍රණ ස්වරූපය

(ඉ) ශ්‍රවණ ස්වරූපය

(iv) මාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන තොරතුරු හේතු කොටගෙන සමාජයට එල්ලවන පහත බලපෑම් **හතර** පිළිබඳව අදහස් දක්වන්න.

(අ) සාම්ප්‍රදායික භාෂාව වෙනස් වීම (ආ) අවර ගණයේ රසවින්දනයට හුරු වීම

(ඉ) ප්‍රචණ්ඩකාරී සිදුවීම් නිතර ඉදිරිපත් වීම (ඊ) නිෂ්ඵල හුරු පුරුදුවලට යොමු වීම

**4.** නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය ව්‍යාප්තිය රටක ජනමාධ්‍ය භාවිතයට තීරණාත්මක බලපෑමක් සිදු කර ඇත.

(i) කිසියම් රටක ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යවලින් නව මාධ්‍ය වෙනස්වීමට බලපාන ලක්ෂණය කුමක් ද?

(ii) ග්‍රාහක වර්ගීකරණයට අනුව ප්‍රධාන ග්‍රාහක වර්ග **දෙක** නම් කරන්න.

(iii) අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අන්තර්ජාලය වැදගත් වන ආකාරය කරුණු **තුනකින්** පැහැදිලි කරන්න.

(iv) සමාජ මාධ්‍ය භාවිතයේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම **දෙකක්** විස්තර කරන්න.

**5.** සන්දේශ නිර්මාණශීලීව සකස් කිරීම ග්‍රාහක ආකර්ෂණයට හේතු වේ.

(i) නිර්මාණයක පවත්නා ගුණාංග **දෙකක්** ලියන්න.

(ii) පුවත්පත් මාධ්‍යය තුළ නිශ්චල ඡායාරූප භාවිතයේ වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) ගුවන්විදුලි මාධ්‍යය තුළ නිර්මාණශීලීව ඉදිරිපත් කළ හැකි වැඩසටහන් ආකෘති **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී යොදා ගන්නා පහත ප්‍රකාශන විධි පිළිබඳ උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.

(අ) භාෂාත්මක ප්‍රකාශන විධි (ආ) ශ්‍රව්‍ය ප්‍රකාශන විධි

(ඉ) දෘශ්‍ය ප්‍රකාශන විධි (ඊ) ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි

**6.** රාජිනීගේ ව්‍යාපාරික ආයතනයට නව කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමට තීරණය කෙරිණි. ඒ සඳහා අවශ්‍ය විවිධ උපකරණ පිළිබඳ කළමනාකරුවන් අතර සාකච්ඡාවක් පැවැතිවිණි.

(i) කාර්යාලයට අවශ්‍ය ප්‍රධාන දුරකථන වර්ග **දෙක** නම් කරන්න.

(ii) කාර්යාලයක මාධ්‍ය ක්‍රියාවලියට පාදක වන කාර්යන් **හතර** නම් කරන්න.

(iii) ව්‍යාපාරික ආයතනයට වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) ආයතනයෙහි CCTV කැමරා සවි කිරීමේ ඇති වැදගත්කම උදාහරණ **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

**7.** රටක ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය සමාජයට ප්‍රබල බලපෑමක් සිදුකරනු ලබයි.

(i) රජයට හිමි රූපවාහිනී ආයතනයක් නම් කරන්න.

(ii) පුවත්පතක ප්‍රවෘත්ති අංශය තුළ සිටින සංස්කාරකවරු දෙදෙනකුගේ නිල තනතුරු නාම **දෙකක්** දක්වන්න.

(iii) ජනමාධ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ පහත තේමා පිළිබඳ විස්තර කරන්න.

(අ) මාධ්‍ය හිමිකරු (ආ) මාධ්‍යවේදියා (ඉ) ග්‍රාහකයා

(iv) ජනමාධ්‍ය ක්ෂේත්‍රය සඳහා රජය මගින් සිදු කරනු ලබන සෘජු මැදිහත්වීමක් සහ වක්‍ර මැදිහත්වීමක් පැහැදිලි කරන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)

# 87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)

# 87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| පළමු ප්‍රශ්න පත්‍රයට ලකුණු 1 x 40 | - | 40 |
| දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා | - | 60 |
| මුළු ලකුණු | - | 100 |

## II වන පත්‍රය

| | | |
|---|---|---|
| 1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10 | - | 20 |
| 2 වන - 7 වන ප්‍රශ්න සඳහා තෝරා ගත් ප්‍රශ්න 4 ලකුණු 10 බැගින් | - | 40 |
| | | 60 |

## කොටස් ලකුණු බෙදීම

2 - 7 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

| | | | |
|---|---|---|---|
| I කොටසට | - | ලකුණු | 1 |
| II කොටසට | - | ලකුණු | 2 |
| III කොටසට | - | ලකුණු | 3 |
| IV කොටසට | - | ලකුණු | 4 |
| | | | 10 |

## I - ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

බහුවරණ ප්‍රශ්ණ පත්‍රයේ ඇති සියලුම ප්‍රශ්න දැනුම උරගා බැලීමක් සහ දිනපතා ජීවිතයට අදාළ කර ගැනීමේ හැකියාව තහවුරු කිරීමත් අපේක්ෂිත ය. ඒ සඳහා 10 සහ 11 ශ්‍රේණි පොත් නිසියාකාරව හදාරා තිබීම වැදගත් ය. වරණ අතුරින් ඉතා ම සුදුසු වරණය තේරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවනට හැකි වීම මෙහිදී බලාපොරොත්තු වේ.

මෙම පත්‍රයේ එක් ප්‍රශ්නයකට එක ලකුණ බැගින් හිමි වේ. I වන පත්‍රයට හිමිවන මුළු ලකුණු ගණන 40 කි.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................................ √ $\frac{4}{5}$

(ii) ............................................................ √ $\frac{3}{5}$

(iii) ............................................................ √ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම
   - I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
   - II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
   - III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
   - IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
   - V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
   - VI. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත්**

**පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් **කර අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

# 87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I පත්‍රය

### ආවරණය කරනු ලබන ඉගෙනුම් ඵල

1. මුද්‍රණ ශිල්පය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
2. අන්තර් පුද්ගල සන්නිවේදනය පිළිබඳ අවබෝධය පරීක්ෂා කරයි.
3. දේශීය ගුවන් විදුලි ඉතිහාසය පිළිබඳ ආවර්ජනය කරයි.
4. සමූහ සන්නිවේදනය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
5. මුද්‍රිත ඉතිහාසය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
6. පුවත්පත් සංස්කරණය පිළිබඳ භාවිත ස්වරූපය ගෙන හැර දක්වයි.
7. අවාචික සන්නිවේදනය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
8. පුවත්පතක මාධ්‍යමය භාවිතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
9. නීත්‍යානුකූල දේශ සීමාවක් තුළ ජීවත් වන පුද්ගලයින් පිළිබඳ දැනුම ගෙන හැර දක්වයි.
10. තොරතුරු දාම පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
11. පරිගණකය ආශ්‍රිත මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ අවබෝධය ගෙන හැර දක්වයි.
12. පුවත්පත් සම්බන්ධ නඩු කටයුත්තක දී වගකීම පිළිබඳ භාවිතය පෙන්නුම් කරයි.
13. සන්නිවේදන වර්ග හා ස්වරූප පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
14. දේශීය රූපවාහිනී ඉතිහාසය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
15. අන්තර්ජාල පහසුකම් පිළිබඳ භාවිතය විග්‍රහ කරයි.
16. ගුවන්විදුලි නාලිකාවල තරංග සම්ප්‍රේෂණය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
17. පුවෘත්ති හා වාර්ගිකත්වය පිළිබඳ විවිධතා අවබෝධයට ලක් කරයි.
18. මාධ්‍ය භාවිතය පිළිබඳව ඇති භාවිතය විමසයි.
19. අත්සන හා නිලමුද්‍රාව භාවිතය විමර්ශනය කරයි.
20. සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
21. ප්‍රවෘත්තියක ගුණාංග පිළිබඳව ඇගයීමට ලක් කරයි.
22. පුවත් පත් ප්‍රකාශනයේ පියවර පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
23. රාජ්‍ය මාධ්‍ය භාවිතය පැහැදිලි කරයි.
24. දෘෂ්ටියේ අඛණ්ඩතා සිද්ධාන්තය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
25. ගුවන් විදුලි මාධ්‍ය වැඩසටහන් පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
26. මාධ්‍ය හා ග්‍රාහකයා අතර සම්බන්ධය ඇගයීමට ලක්කරයි.
27. යටිකුරු පිරමීඩාකාර වාර්තාකරණය පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
28. රූපවාහිනී රියැලටි වැඩසටහනක භාවිත ලක්ෂණ පැහැදිලි කරයි.
29. ශ්‍රව්‍ය ප්‍රකාශන විධි භාවිතය ගෙන හැර දක්වයි.
30. ඡායාරූපකරණය පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
31. තොරතුරු සන්නිවේදනයකට පුද්ගලයකු සතු අවබෝධය ගෙන හැර දක්වයි.
32. මුද්‍රණ ක්‍රමවල භාවිතය ගෙන හැර දක්වයි.
33. දෘශ්‍ය සංඥා විද්‍යුත් ක්‍රමවේදය ඔස්සේ ප්‍රතිනිර්මාණය පිළිබඳ භාවිතය හඳුනා ගනී.
34. ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ භාවිත ස්වභාවය හඳුනා ගනී.
35. සාම්ප්‍රදායික සන්නිවේදනයේ භාවිතය පිළිබඳ ප්‍රකට කරයි.
36. පරිගණකයක් භාවිතයෙන් තොරතුරු ඉදිරිපත් කරන යන්ත්‍ර පිළිබඳ භාවිත දැනුම දක්වයි.
37. ග්‍රාහකයින්ගේ ස්වභාවය පිළිබඳ ඇගයීමක් ලබාදෙයි.
38. අන්තර්ජාලයේ පලකරන පුවත්පත් අයත් මාධ්‍ය පිළිබඳ භාවිතය ඇගයීමක යෙදේ.
39. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පුරවැසි හිමිකම පිළිබඳ භාවිතය පිළිබඳ ඇගයීමක යෙදෙයි.
40. සන්නිවේදන ස්වරූපය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය ගෙන හැර දක්වයි.

# ලකුණු දීමේ උපදෙස්

I වන අනිවාර්ය ප්‍රශ්නයට කොටස් 10 ක් ඇතුළත් ය. එක් කොටසකට ලකුණු 02 බැගින් පිරිනැමේ.

සෙසු තෝරාගත් ප්‍රශ්නවලට ලකුණු පිරිනැමිය යුත්තේ

| | | | |
|---|---|---|---|
| I | කොටසට | - | ලකුණු 1 |
| II | කොටසට | - | ලකුණු 2 |
| III | කොටසට | - | ලකුණු 3 |
| IV | කොටසට | - | ලකුණු 4 |
| | | | 10 |

තෝරාගත් ප්‍රශ්න 04 ට 10 x 4 = 40

II වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.

රහසයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை – 2023 (2024)
## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: 87

විෂයය / பாடம்: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

| ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 2 | 21. | 3 | 31. | 3 |
| 02. | 2 | 12. | 1 | 22. | 2 | 32. | 4 |
| 03. | 3 | 13. | 2 | 23. | 2 | 33. | 3 |
| 04. | 1 | 14. | 1 | 24. | 4 | 34. | 3 |
| 05. | 2 | 15. | 4 | 25. | 2 | 35. | 4 |
| 06. | 2 | 16. | 3 | 26. | 1 | 36. | 1 |
| 07. | 1 | 17. | 3 | 27. | 3 | 37. | 2 |
| 08. | 2 | 18. | 4 | 28. | 3 | 38. | 4 |
| 09. | 2 | 19. | 4/3 | 29. | 1 | 39. | 3 |
| 10. | 4 | 20. | 2 | 30. | 2 | 40. | 1 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | |
|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 25 / 40 |
| I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## II පත්‍රය

**ප්‍රශ්න අංක 01**

1. තොරතුරු හුවමාරුව සන්නිවේදන ක්‍රියාවලියේ මූලික කාර්යයයි.
   (i) මිනිසාට තොරතුරු වැදගත් වන ප්‍රධාන අවස්ථා **දෙකක්** නම් කරන්න.
   (ii) තොරතුරු මගින් ඉටු කෙරෙන සමාජ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.
   (iii) ශ්‍රී ලංකාවේ පුරාතන යුගයෙහි තොරතුරු ලබා දීම සඳහා භාවිත කළ විධික්‍රම **දෙකක්** ලියන්න.
   (iv) තොරතුරු රැස් කරන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග **දෙකක්** නම් කරන්න.
   (v) ප්‍රධාන සන්නිවේදන වර්ග **දෙකක්** ලියන්න.
   (vi) තොරතුරු සම්ප්‍රේෂණ මෙවලමක් වන ගුවන්විදුලියේ නිර්මාතෘවරයා කවුද?
   (vii) සන්නිවේදනය පිළිබඳ ෂැනන් සහ වීවර් ගේ නිර්වචනය ලියන්න.
   (viii) විධිමත් සන්නිවේදනයේ දී දැකිය හැකි සන්නිවේදන ආකෘති **දෙකක්** සඳහන් කරන්න.
   (ix) නූතන තොරතුරු සන්නිවේදනයේ දී වැදගත් වන පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.
   (x) නිර්මාණාත්මක සන්නිවේදනයෙහි ලා භාවිත සිනමා මාධ්‍ය හා සම්බන්ධ 'දෘෂ්ටියේ අඛණ්ඩතාව' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

i.
තොරතුරු දැන ගැනීමේ පුද්ගල අවශ්‍යතාව
තොරතුරු දැන ගැනීමේ සමාජ අවශ්‍යතාව

ii.
- රාජ්‍ය ආයතනවල කටයුතු පවත්වා ගැනීම
- පෞද්ගලික ව්‍යාපාර හා වෙනත් ආයතන පවත්වාගෙන යාම
- සමාජ සුභසාධක සංවිධානවල කටයුතු
- විවිධ දේශපාලනික සංවිධානවල කාර්යයන්
- විවිධ ජන කොටස්වල සංස්කෘතික වටිනාකම් පවත්වාගෙන යාම
- විවිධ ආගමික කණ්ඩායම්වල කටයුතු පවත්වාගෙන යාම
- සමාජයේ පොදු ගැටලු නිරාකරණය සඳහා
- සියලු ආයතන, සංවිධාන, සමාජ කණ්ඩායම් හා රජය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීම

iii.
රේඛා, සංඥා, සංකේත, චිත්‍ර, සටහන්, රූපාක්ෂර හා අක්ෂර මාලා

iv.
- පුවත් ඉව
- තොරතුරු මූලාශ්‍ර පිළිබඳ දැනුවත් බව
- ඉවසීම
- හොඳ නිරීක්ෂකයෙකු වීම
- ආචාරශීලී බව
- සුහද බව

- කාල කළමනාකරණය
- විචක්ෂණ බව
- අපක්ෂපාත බව
- ස්ථිරසාරතාව
- උපායශීලී බව

v.

අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
අන්තර්පුද්ගල/ පුද්ගලාන්තර සන්නිවේදනය
සමූහ සන්නිවේදනය
ජන සන්නිවේදනය
මහජන සන්නිවේදනය
අතථ්‍ය සන්නිවේදනය

vi.

ගුග්ලි එල්මෝ මාර්කෝනි

vii.

- සන්නිවේදනය යනු යම් තැනකදී නිර්මාණය කර ගත් හෝ තෝරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන්ම හෝ ඊට සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය කිරීමයි.
  - ෂැනොන් සහ වීවර් -
- තොරතුරු මූලාශ්‍රය, සන්දේශය, සම්ප්‍රේෂකය, සංඥා, ලැබූ සංඥා, ග්‍රාහකයා, අග්‍රස්ථානය යන ෂැනොන් වීවර් සන්නිවේදන ආකෘතියේ මූලික අංග හෝ ආකෘතිය ද නිවැරදි වේ. (අංග 04 ක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙක ලබා දෙන්න. අංග 02 ක් පමණක් ලියා ඇත්නම් ලකුණු එකක් ලබා දෙන්න.)

viii.

චක්‍රීය ආකෘතිය
දාම ආකෘතිය
වයි ආකෘතිය
රෝද ආකෘතය

ix.

අඩු පිරිවැය
ආකර්ෂණීය නිමාව
ඉක්මන් බව
පහසුව
කාර්යක්ෂමතාව

x.

වේගයෙන් චලනය වන වස්තුවක එක් එක් පිහිටීම් අතර පරතරය දැකිය නොහැකි වන ආකාරයට මිනිස් ඇස සකස් වී තිබීම

**(ලකුණු 2 x 10 = 20)**

**2.** පාසල් වර්ණ ප්‍රදානෝත්සවයේ නිවේදන කටයුතු සඳහා රවී සහ කමලාගේ නම් යෝජනා විය.

(i) මෙම උත්සවයට පෙර රවී හා කමලා ඒ පිළිබඳව වාචික සන්නිවේදනයේ යෙදේ. වාචික සන්නිවේදනය යනු කුමක් ද?

වචන භාවිතය මගින් සිදු කරන සන්නිවේදනය වාචික සන්නිවේදනය ලෙස හැඳින්වේ.

**(ලකුණු 01)**

(ii) වාචික සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා අවධානය යොමු කළ යුතු භාෂාව සම්බන්ධ අංග **දෙකක්** පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

- උච්චාරණය -
  කුමන භාෂාවකට වුවද උච්චාරණ විලාසයක් තිබේ. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා කතා කිරීමේදී මිශ්‍ර භාෂා ශෛලියක් අනුගමනය කිරීම අනුචිත වේ. තමා කතා කරන භාෂාව නිවැරදිව උච්චාරණය කිරීමේ හැකියාව තිබිය යුතුය. උච්චාරණ දෝෂ ඇති විට කථිකයා අදහස් කරන දේ ඉදිරිපත් නොවන්නට පුළුවන. එවිට සන්නිවේදනය අසාර්ථක වේ. එදිනෙදා කතා බහේ දී නිවැරදි උච්චාරණය කෙරෙහි අවධානය යොමු නොකළ ද ප්‍රසිද්ධ කතාවක් පැවැත්වීමේදී එම නොසැලකිල්ල නිසා කථිකයා අවමානයට ලක්විය හැකිය.

- අර්ථ ගැන්වීම -
  වාචික සන්නිවේදනයේ දී භාෂාව යොදා ගන්නේ යම් අර්ථයක් දැක්වීම සඳහා ය. කථිකයෙකු විසින් යොදා ගනු ලබන යෙදුම්, භාෂා ප්‍රයෝග, වචන, පර්යාය වචන අලංකාර ආදිය මගින් අර්ථ ගැන්වීම වඩාත් සරල හා ප්‍රියජනක වේ.

  තමා පවසන දේ නිරවුල්ව තෝරා බේරා ගනිමින් අදහස් මනාව පෙළ ගස්වා කථනයේ යෙදීම මගින් පවසන දේ වඩා අර්ථවත්ව ප්‍රකාශ කළ හැකිය. වැඩි පිරිසක් ඉදිරියේ කථාවක් පවත්වන විට හෝ ගුවන් විදුලිය හෝ රූපවාහිනිය හෝ ජන මාධ්‍යයකින් යමක් කියන විට එය විශාල ජනගහණයකට තේරුම් යන ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

- යෝග්‍යතාව -
  අවස්ථාවට, අසන්නාට හා කථනයේ අරමුණට යෝග්‍ය ලෙස වචන හැසිරවීම කථිකයෙකුගේ වගකීමකි.

  උදා:
  පෙර පාසල් වියේ දරුවන් පිරිසකට තමන්ගේ පිරිසිදුකම පිළිබඳ උපදෙස් දීම

  උදා:
  යම් පිරිසකට සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ උපදෙස් දීමේ වැඩසටහනක්

**(ලකුණු 02)**

(iii) සමූහ සන්නිවේදනයේ විශේෂතා **තුනක්** ඉහත උත්සව අවස්ථාව ඇසුරෙන් විස්තර කරන්න.

1. සන්නිවේදකයා එක් අයෙක් වන අතර ග්‍රාහකයන් සමූහයක් වන නිසා ඔවුන් විවිධ වන්නට පුළුවන.
2. සන්නිවේදකයා හා ග්‍රාහකයන් අතර සම්බන්ධතාව යම් ප්‍රමාණයක දුරස්ථභාවයක් ගනී. සමූහයේ ප්‍රමාණය වැඩි වන විට එම දුරස්ථභාවය ද වැඩි වේ. එහි සමීපස්ථභාවයක් ඇති කර ගත හැක්කේ සමූහ සන්නිවේදනය අතර අන්තර් පුද්ගල සන්නිවේදනය යොදා ගැනීමෙනි.
3. සමූහ සන්නිවේදනයේ දී කථිකයා ප්‍රමුඛ වන අතර ග්‍රාහකයන් ද්විතීය වේ. එහෙත් ග්‍රාහකයන් සංඛ්‍යාව වැඩි නිසා ඔවුන්ගේ බලය වැඩිය. මේ නිසා කථිකයාට මේ සියලු ග්‍රාහකයන් යටපත් කර ගැනීමේ හැකියාවක් තිබිය යුතුය.
4. සමූහයේ සිටින සියල්ලන්ට පොදු වන සේ මාධ්‍ය භාවිත කරන්නට සන්නිවේදකයාට සිදු වේ.
5. ග්‍රාහකයන් විවිධ අත්දැකීම් සහිත අය වූ විට කථිකයා විසින් ඉදිරිපත් කරන සන්දේශය විවිධ ආකාරයෙන් අර්ථකථනය කර ගැනීමට යොමුවිය හැකිය.
6. ග්‍රාහකයන්ගේ හෙවත් සම්මුඛ ශ්‍රාවකයන්ගේ අවධානය යොමුකර ගැනීමට ආකර්ෂණීය ලෙස සන්නිවේදන කාර්යයේ යෙදෙන්නට කථිකයාට සිදු වේ.
7. සමූහ සන්නිවේදනයට දායක වන කථිකයා සමූහයට මැනවින් ප්‍රදර්ශනය වන නිසා කථිකයාගේ ඇස් සම්බන්ධතාව, අවාචික සන්නිවේදන විධි හා ශාරීරික ස්වරූපය අතිශයින් වැදගත් වේ.
8. සමූහය සමග හොඳ සන්නිවේදන ගනුදෙනුවක් කිරීමට නම්, මහජන ඇමතුම් උපකරණ වැනි තාක්ෂණික මෙවලම් භාවිත කරන්නට කථිකයාට සිදු වේ.
9. කථිකයා විසින් ඉදිරිපත් කරන සන්දේශය වඩාත් තහවුරු කිරීම සඳහා ශ්‍රව්‍ය හා දෘශ්‍ය තාක්ෂණික මෙවලම් යොදා ගන්නට සිදු වේ.
10. ග්‍රාහක ආකර්ෂණය අඛණ්ඩව පවත්වා ගෙන යන්නට සුවිශේෂ ලෙස සිය කථන නිපුණතාව යොදා ගන්නට සන්නිවේදකයාට සිදු වේ.

**(ලකුණු 03)**

**(පාසල් වර්ණ ප්‍රදාන උත්සව අවස්ථාව ඇසුරින් විස්තර කළ යුතුය.)**

(iv) මෙම උත්සවය පටිගත කළ වැඩසටහනක් ලෙස ගුවන්විදුලි මාධ්‍ය තුළ ප්‍රචාරය විය. ගුවන්විදුලි මාධ්‍යයේ ලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

1. ශ්‍රව්‍ය මාධ්‍යයක් වීම
2. ජංගමශීලී මාධ්‍යයක් වීම
3. අඩු වියදම් සහිත මාධ්‍යයක් වීම
4. භූගෝලීය බාධා අවම ජනමාධ්‍යයක් වීම
5. පහසුවෙන් පරිහරණය කළ හැකි මාධ්‍යයක් වීම
6. ක්‍රියාත්මක කිරීමට ඕනෑම කෙනෙකුට හැකි වීම
7. ඕනෑම තැනක සිට ශ්‍රවණය කිරීමට හැකි වීම
8. පරිකල්පනීය මාධ්‍යක් වීම
9. පුද්ගල කේන්ද්‍රීය මාධ්‍යයක් වීම

**(ලක්ෂණ හතරක් විස්තර කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)**
**(ලකුණු 04)**

**3.** විවිධ මාධ්‍ය මගින් සිදු කරන තොරතුරු විසරණ ක්‍රියාවලිය සංකීර්ණ වූවකි.

(i) බහුල ලෙස යොදා ගනු ලබන තොරතුරු වාර්තාකරණ ක්‍රම **දෙක** නම් කරන්න.

- ඍජු වාර්තාකරණය
- නිර්මාණාත්මක වාර්තාකරණය

**(ලකුණු 01)**

(ii) පුවත්පත් වාර්තාකරණයේ දී 'පෙළ' සහ 'රූපය' යන්නට අයත් වන අංග **දෙක** බැගින් වෙන වෙන ම සඳහන් කරන්න.

පුවත්පතක පෙළ යනු අකුරු භාවිතයට ගනිමින් ඉදිරිපත් කරන දේ ලෙස හඳුනාගත හැකිය.
පෙළ - අකුරු, වචන, වාක්‍ය, ඡේද, සිරස්තල
රූපය - ඡායාරූප, සිතුවම්, කාටූන්, රූප, සිතියම්, ප්‍රස්තාර

**(ඉහත සාධක වෙන වෙනම පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)**

**(ලකුණු 02)**

(iii) ගුවන්විදුලි පිටපත් රචනයේ දී සැලකිලිමත් වන පහත සාධකවල සුවිශේෂතා වෙන වෙන ම පැහැදිලි කරන්න.

(අ) භාෂාවේ ස්වරූපය (ආ) ආමන්ත්‍රණ ස්වරූපය
(ඉ) ශ්‍රවණ ස්වරූපය

(අ) භාෂාවේ ස්වරූපය

භාෂාවේ ස්වරූපය - ලියන්නේ කියවීමට නොව කතා බහටය. එය ලේඛන ව්‍යවහාරය නොව කථන ව්‍යවහාරයකි. වැඩසටහනේ අන්තර්ගතය සහ ග්‍රාහක පිරිස අනුව භාෂාව තීරණය වේ.

(ආ) ආමන්ත්‍රණ ස්වරූපය

ආමන්ත්‍රණ ස්වරූපය - ලිවිය යුත්තේ එක් පුද්ගලයෙකු අරභයාය. එනම් පුද්ගලික ඇමතුමකි. එය ඔබ හා මම අතර කෙරෙන්නකි. එම ආමන්ත්‍රණය මිත්‍රශීලී විය යුතුය.

(ඉ) ශ්‍රවණ ස්වරූපය

ශ්‍රවණ ස්වරූපය - ඇසෙන්නේ එක් වරක් පමණි. එහෙයින් ඇසූ මුල් අවස්ථාවේම අසන්නාට තේරුම් යා යුතුය. මිනිස් කටහඬ සංගීතය, නිහඬ බව ශබ්ද ප්‍රයෝග භාවිත කරමින් උපක්‍රමශීලීව ග්‍රාහකයා ඇමතීම සිදු කළ හැකිය.

**(ඉහත සාධකවල සුවිශේෂතා වෙන වෙනම පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)**

**(ලකුණු 03)**

(iv) මාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන තොරතුරු හේතු කොටගෙන සමාජයට එල්ලවන පහත බලපෑම් **හතර** පිළිබඳව අදහස් දක්වන්න.

(අ) සාම්ප්‍රදායික භාෂාව වෙනස් වීම  (ආ) අවර ගණයේ රසවින්දනයට හුරු වීම

(ඉ) ප්‍රචණ්ඩකාරී සිදුවීම් නිතර ඉදිරිපත් වීම  (ඊ) නිෂ්ඵල හුරු පුරුදුවලට යොමු වීම

(අ) සාම්ප්‍රදායික භාෂාව වෙනස්වීම -
රූපවාහිනී, ගුවන්විදුලි වැඩසටහන්වල සිංහල, ඉංග්‍රීසි මිශ්‍ර භාෂාවක් භාවිතය
උදා: වෙළෙඳ දැන්වීම, ටෙලි නාට්‍ය, නිවේදන කටයුතු යන වැඩසටහන්වල දී භාෂාව මිශ්‍රව යොදා ගැනීම

(ආ) අවර ගණයේ රසවින්දනය හුරුවීම -
අනවශ්‍ය ලෙස ලිංගිකත්වය හුවා දක්වන සරල විනෝදය පමණක් ගෙන දෙන මාධ්‍ය වැඩසටහන් මගින් ළමයාගේ රසවින්දන ශක්තිය හා බුද්ධිය මොට කිරීම සිදු විය හැකිය.
උදා:
ගීතවල රූප රචනා, ටෝක් ෂෝ වැඩසටහන්, ටෙලි නාට්‍ය

(ඉ) ප්‍රචණ්ඩකාරී සිදුවීම් නිතර ඉදිරිපත් වීම
පුවත්පත්, රූපවාහිනී, අන්තර්ජාලය වැනි මාධ්‍යවල අන්තර්ගත සන්දේශවල ප්‍රචණ්ඩත්වය සහිත තොරතුරු දක්නට ලැබෙයි. ඒවා නිතර පරිහරණය කිරීම නිසා ළමුන් ප්‍රචණ්ඩත්වයට හුරු වීම අයහපත් වේ.
උදා:
ටෙලිනාට්‍ය, ප්‍රවෘත්තිවල සඳහන් ඇතැම් තොරතුරු, ගීතවල රූප රචනා

(ඊ) නිෂ්ඵල හුරු පුරුදුවලට යොමු වීම
අධික ලෙස රූපවාහිනිය නැරඹීමට ඇබ්බැහි වීම, පරිගණක ක්‍රීඩාවලට ඇබ්බැහි වීම, වෙළෙඳ දැන්වීම්වලින් ඉදිරිපත් කරන නොයෙකුත් ප්‍රයෝජනවත් නොවන ආහාර ලබා ගැනීමට හුරු වීම ආදිය ඵලදායී නොවන හුරු පුරුදු කිහිපයකි. සාමාන්‍යයෙන් ළමයෙකු දිනකට පැය 5 - 6 ක පමණ කාලයක් රූපවාහිනිය ඉදිරියේ ගත කරන බව සමීක්ෂණ වාර්තා පෙන්වා දෙයි. රූපවාහිනිය ළමුන් ක්‍රීඩා පිටියෙන් ඈත් කර තබයි. ශාරීරික ව්‍යායාම ප්‍රමාණවත් ලෙස නොලැබීම නිසා ළමුන් අතර බෝ නොවන රෝග බහුලව වාර්තා වේ.

**(ඉහත බලපෑම් හතර පිළිබඳව කෙටියෙන් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 04)**

4. නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය ව්‍යාප්තිය රටක ජනමාධ්‍ය භාවිතයට තීරණාත්මක බලපෑමක් සිදු කර ඇත.

(i) කිසියම් රටක ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යවලින් නව මාධ්‍ය වෙනස්වීමට බලපාන ලක්ෂණය කුමක් ද?

භූගෝලීය වශයෙන් සීමා නොවීම

**(ලකුණු 01)**

(ii) ග්‍රාහක වර්ගීකරණයට අනුව ප්‍රධාන ග්‍රාහක වර්ග **දෙක** නම් කරන්න.

1. සක්‍රීය ග්‍රාහකයා
2. නිෂ්ක්‍රීය ග්‍රාහකයා

**(ලකුණු 02)**

(iii) අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අන්තර්ජාලය වැදගත් වන ආකාරය කරුණු **තුනකින්** පැහැදිලි කරන්න.

1. මිතුරන් අතර දැනුම හා තොරතුරු හුවමාරු කරගැනීම
2. ජාතික හා ලෝක මට්ටමින් දැනුම හා තොරතුරු හුවමාරු කරගැනීම
3. බහු මාධ්‍ය පරිහරණය මගින් ඉන්ද්‍රිය සංවේදනයන් දියුණු වීම
4. ලෝකය පිළිබඳ අවබෝධය ලබාගැනීමට හැකි වීම
5. විවිධ ජන කණ්ඩායම් හා සංස්කෘතීන් පිළිබඳ ඉගෙනීමට හැකි වීම
6. විවිධ විෂයයන්ට අදාළ තොරතුරු රැස් කළ හැකි වීම
7. අධ්‍යාපනය ප්‍රියජනක වීම
8. වෙනත් භාෂා ඉගෙනීම පහසු කර වීම
9. අවශ්‍ය පරිදි පරිහරණය කිරීමේ පහසුවක් තිබීම
10. තොරතුරු බාගත කිරීමේ හැකියාව
11. දත්ත සංචිත වෙත ප්‍රවේශ වීමේ හැකියාව (උදා: e-books, විශ්වකෝෂ, පර්යේෂණ වාර්තා

**(ඉහත කරුණුවලින් 03ක් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 03)**

(iv) සමාජ මාධ්‍ය භාවිතයේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම **දෙකක්** විස්තර කරන්න.

1. තමා පිළිබඳ සත්‍ය තොරතුරු වසන් කරමින් අන් අය රැවටීමෙන් වැළකීම
2. වැරදි හා අසත්‍ය තොරතුරු ජාලයට එක් කිරීමෙන් වැළකීම
3. තමන්ගේ පෞද්ගලික තොරතුරු අනවශ්‍ය අය වෙත ලබා දීමෙන් වැළකීම
4. සමාජ සදාචාරයට හානි නොවන සේ භාවිත කිරීම
5. අන් අයගේ පෞද්ගලිකත්වයට හානි නොවන සේ භාවිත කිරීම
6. සන්දේශ නිර්මාණශීලීව සකස් කිරීම ග්‍රාහක ආකර්ෂණයට හේතු වීම

**(ඉහත කරුණුවලින් 02ක් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 2 x 2 = 4)**

5. සන්දේශ නිර්මාණශීලීව සකස් කිරීම ග්‍රාහක ආකර්ෂණයට හේතු වේ.

(i) නිර්මාණයක පවත්නා ගුණාංග **දෙකක්** ලියන්න.

1. නැවුම් බව
2. සුවිශේෂී බව
3. ප්‍රයෝජනවත් බව
4. අර්ථ සම්පන්න බව
5. ගුණාත්මක සන්නිවේදනයක් සිදු වීම
6. ඉහළ රුචිකත්වයක් ඇති කිරීම
7. සංවේදී බව
8. සියුම් ලෙස සිතීමේ හැකියාව
9. අපූර්ව බව

**(ලකුණු 01)**

(ii) පුවත්පත් මාධ්‍යය තුළ නිශ්චල ඡායාරූප භාවිතයේ වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

1. අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව
2. තාත්වික බව නිසා ග්‍රාහක විශ්වසනීයත්වය දිනා ගැනීමට හැකි වීම
3. පහසුවෙන් ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීමට හැකි වීම
4. පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගතවීමට ඇති හැකියාව
5. ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට ඇති හැකියාව

**(කරුණු 02 ක් විස්තර කර ඇති නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 02)**

(iii) ගුවන්විදුලි මාධ්‍යය තුළ නිර්මාණශීලීව ඉදිරිපත් කළ හැකි වැඩසටහන් ආකෘති **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

1. සම්මුඛ සාකච්ඡා
2. සංවාද
3. වාර්තාමය වැඩසටහන්
4. විචිත්‍රාංග වැඩසටහන්
5. සඟරාමය වැඩසටහන්
6. ගුවන් විදුලි නාට්‍ය
7. සජීවී විස්තර ප්‍රචාර
8. වාර්තා කථන
9. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
10. සාකච්ඡා
11. දුරකථන සංවාද
12. සංගීත වැඩසටහන්
13. කථා
14. නිවේදන

**(ආකෘති තුනක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)**

**(ලකුණු 03)**

(iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී යොදා ගන්නා පහත ප්‍රකාශන විධි පිළිබඳ උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.

(අ) භාෂාත්මක ප්‍රකාශන විධි (ආ) ශ්‍රව්‍ය ප්‍රකාශන විධි

(ඉ) දෘශ්‍ය ප්‍රකාශන විධි (ඊ) ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි

(අ) භාෂාත්මක ප්‍රකාශන විධි

- භාෂාව මුල් කරගෙන සන්නිවේදනය සිදු කිරීම භාෂාත්මක ප්‍රකාශන විධි ලෙස හැඳින්වේ.
- භාෂාත්මක ප්‍රකාශන විධි අනෙකුත් ප්‍රකාශන විධිවල මෙන්ම නව මාධ්‍යවලද වැඩිපුර භාවිත වේ.
- යම් සිදුවීමක් පිළිබඳ තොරතුරක් සමාජය වෙත ගෙන යාමේ දී ආකර්ෂණීයව හා ගුණාත්මකව ඉදිරිපත් කිරීමට භාෂාත්මක ප්‍රකාශන විධි භාවිත වේ.
- නිර්මාණාත්මක සන්නිවේදනයේදී යොදා ගන්නා භාෂාත්මක ප්‍රකාශන විධි ක්‍රම ලෙස,
  - උපමා උපමේයන්, ප්‍රස්ථා පිරුළු, කෙටිකතා, ව්‍යංග්‍යාර්ථ සහිත භාෂා රටාවන් දැක්විය හැකිය.
- කවිය, කෙටිකතාව, නවකතාව, නාට්‍ය, භාෂාත්මක ප්‍රකාශන විධි භාවිතකරණය නිර්මාණ සඳහා නිදසුන් වේ.

(ආ) ශ්‍රව්‍ය ප්‍රකාශන විධි

- හඬ පදනම් කරගෙන සන්නිවේදනය සිදු කිරීම ශ්‍රව්‍ය ප්‍රකාශනය භාවිත කරන විධි ලෙස හැඳින්වේ.
- සාම්ප්‍රදායික සමාජවල හූව, බෙරහඬ, නළා හඬ වැනි සාම්ප්‍රදායික මාධ්‍යයන් ශ්‍රව්‍ය ප්‍රකාශන විධි ලෙස භාවිත කර ඇත.
- වර්තමානයේ ශ්‍රව්‍ය ප්‍රකාශන විධි ඉතා දියුණු තත්ත්වයකට පත්ව තිබේ.
- එය ස්වාධීන ප්‍රකාශන ස්වරූපයක් ලෙස මෙන්ම වෙනත් සන්නිවේදන ස්වරූප සමග එක්ව ද භාවිත වේ.
- හඬ, නිහඬ බව, සංගීතය හා ශබ්ද ඇසුරෙන් ගුවන් විදුලිය ක්‍රියාත්මක වේ.
- ප්‍රවෘත්තියක් ඉදිරිපත් කිරීමේදී වුවද නිවේදකයාගේ හඬ, කථන ස්වරූපය වැදගත් වේ.
- ගුවන්විදුලියේ දී නිහඬ බව මගින් ද යම් යම් දෑ සන්නිවේදනය කළ හැකිය.
- සංගීතය සුදුසු පරිදි යොදා ගැනීමෙන් නිර්මාණාත්මකව යමක් සන්නිවේදනය කළ හැකිය.
- ගුවන් විදුලියේ සෑම වැඩසටහනකටම පරිකල්පනීය භාෂාවක් භාවිත වේ.

(ඉ) දෘශ්‍ය ප්‍රකාශන විධි

- දැකීම මගින් අවබෝධ කර ගත හැකි යම් තොරතුරක් මගින් සන්නිවේදනය කිරීම දෘශ්‍ය ප්‍රකාශන විධි ලෙස හැඳින්වේ.
- ආදී මිනිසා ඉතා සරල සංඥා, සංකේත, ඉඟි බිඟි හා චිත්‍ර ආදිය මගින් දෘශ්‍ය ප්‍රකාශනය සිදු කර ඇත.
- වර්තමානයේ දියුණු දෘශ්‍ය ප්‍රකාශන විධි භාවිත වේ. අකුරු, අභිනය, ඡායාරූප, චිත්‍ර, සංකේත, සංඥා, වගු ප්‍රස්තාර එයට නිදසුන් ය.
- දෘශ්‍ය ප්‍රකාශන විධි නිර්මාණාත්මක සන්නිවේදනය සඳහා යොදා ගන්නා අවස්ථා ලෙස දැන්වීම්, ප්‍රදර්ශන පුවරු, අත් පත්‍රිකා සඟරා, දැක්විය හැක.

- දෘශ්‍ය ප්‍රකාශනයක් යමක් දෙස මතුපිටින් බැලූ විට පෙනෙන දේට වඩා ගැඹුරු අර්ථයක් ලබාදීම සඳහා නිර්මාණාත්මක ලෙස භාවිත කළ හැකිය.

(ඊ) ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි

- ශබ්දය හා රූපය යන අංශ දෙකම යොදා ගනිමින් තොරතුරක් සන්නිවේදනය කිරීම ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි වේ.
- රූපවාහිනිය, සිනමාව ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි බහුලව භාවිත කරයි.
- ජංගම දුරකථනය, පරිගණකය, අන්තර්ජාලය ආශ්‍රිත නව මාධ්‍යවල ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි භාවිත වේ.
- ශබ්දය හා රූපය ප්‍රබල ලෙස භාවිත කළ හැකි බැවින් යම් තොරතුරක් හෝ සංකල්පයක් සජීවී බවින් යුක්තව නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශනය සතුව ඇත.
- අනෙකුත් ප්‍රකාශන විධිවලට වඩා සාපේක්ෂව ඉහළ ග්‍රාහක ආකර්ෂණයක් ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධිවලින් ලබා ගත හැකිය.
- ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි ආකර්ෂණීය බවින් යුක්ත නිසා ග්‍රාහකයාට තොරතුරක් ලබාගැනීමට ඇති හැකියාව ඉහළ මට්ටමක පවතී.

**(ප්‍රකාශන විධි පිළිබඳව උදාහරණ ඇසුරෙන් පැහැදිලි කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)**

**(ලකුණු 04)**

**6.** රාජිනීගේ ව්‍යාපාරික ආයතනයට නව කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමට තීරණය කෙරිණි. ඒ සඳහා අවශ්‍ය විවිධ උපකරණ පිළිබඳ කළමනාකරුවන් අතර සාකච්ඡාවක් පැවැත්විණි.

(i) කාර්යාලයට අවශ්‍ය ප්‍රධාන දූරකථන වර්ග **දෙක** නම් කරන්න.

ස්ථාවර දූරකථනය
ජංගම දූරකථනය (සුහුරු ජංගම දූරකථනය/ ස්මාර්ට් ජංගම දූරකථනය)

(ii) කාර්යාලයක මාධ්‍ය ක්‍රියාවලියට පාදක වන කාර්යයන් **හතර** නම් කරන්න.

තොරතුරු විධිමත්ව ලබාගැනීම
තොරතුරු විධිමත්ව රැස්කිරීම
තොරතුරු විධිමත්ව පිළියෙල කිරීම
තොරතුරු විධිමත්ව නිකුත් කිරීම

(ලකුණු ½ x 4 = 02 )

(iii) ව්‍යාපාරික ආයතනයට වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

1. කාර්යාලයේ තොරතුරු වහාම ලෝකය පුරා ඕනෑම අයෙකුට ග්‍රහණය කරගත හැකිවීම
2. කාර්යාලයේ තොරතුරු යාවත්කාලීන කිරීම
3. කාර්යාලයේ කාර්යයන් සමාජයට විවෘත කිරීම
4. කාර්යාලයේ කටයුතු වඩාත් විධිමත්ව හා පිළිවෙළකට කළ හැකි වීම
5. කාර්යාලයේ තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකිවීම
6. වෙබ් අඩවිය ඔස්සේ විවිධ ප්‍රතිචාර වහා ලබා ගත හැකිවීම

**(වාසි තුනක් පිළිබඳව විස්තර කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න)**

**(ලකුණු 1 x 3 = 03)**

(iv) ආයතනයෙහි CCTV කැමරා සවි කිරීමේ ඇති වැදගත්කම උදාහරණ **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

- කිසියම් ආයතනයක සොරකම්, මංකොල්ලකෑම් ආදිය අනාවරණය කරගන්නට සංවෘත රූපවාහිනී දර්ශන යොදා ගත හැකිය.
  උදා: බැංකු මංකොල්ලයක තොරතුරු ලබාගැනීම
  නිමි ඇඳුම් ආයතනයක මුදල් සොරාගැනීම
- කිසියම් ආයතනයක සවිකර ඇති සංවෘත රූපවාහිනී කැමරා මගින් ලබා ගන්නා දර්ශන ආයතන හිමිකරුට නැරඹීමට හැකිය.
  උදා: ස.තො.ස. ආයතනයට සොරකු ඇතුළුවීම
- ආයතනයේ විවිධ ස්ථානවල ඇති CCTV කැමරා මගින් ලබා ගන්නා සන්දේශ එක් පාලක මැදිරියක් නිරීක්ෂණය කිරීමට හැකිවීම
- CCTV කැමරා මගින් ලබා ගන්නා තොරතුරු කාලයක් සංරක්ෂණය කර තැබීමට හැකිවීම
- ව්‍යාපාර ආයතනයේ සේවකයන් අවම ලෙස යොදා ගන්නා අවස්ථාවක ගනුදෙනු කරුවන් හා පැමිණෙන පිටස්තර පුද්ගලයන් ගැන පරීක්ෂාවෙන් සිටීමට CCTV කැමරා යොදා ගත හැකිය.
- ආයතනය ඉදිරියේ ඇති මහාමාර්ගය නිරීක්ෂණය කිරීමට හා ආයතනයේ පරිපාලන කටයුතුවලට (සේවක කාර්යක්ෂම බව නිරීක්ෂණයට වැනි) යොදා ගත හැකිය.

**(උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)**

**(ලකුණු 04)**

7. රටක ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය සමාජයට ප්‍රබල බලපෑමක් සිදුකරනු ලබයි.

(i) රජයට හිමි රූපවාහිනී ආයතනයක් නම් කරන්න.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
ස්වාධීන රූපවාහිනී සේවාව

(ලකුණු 01)

(ii) පුවත්පතක ප්‍රවෘත්ති අංශය තුළ සිටින සංස්කාරකවරු දෙදෙනකුගේ නිල තනතුරු නාම දෙකක් දක්වන්න

ප්‍රාදේශීය ප්‍රවෘත්ති සංස්කාරක
දේශීය ප්‍රවෘත්ති සංස්කරණ කර්තෘ
විදේශීය ප්‍රවෘත්ති සංස්කරණ කර්තෘ

(ලකුණු 02)

(iii) ජනමාධ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ පහත තේමා පිළිබඳ විස්තර කරන්න.

(අ) මාධ්‍ය හිමිකරු (ආ) මාධ්‍යවේදියා (ඉ) ග්‍රාහකයා

(අ) මාධ්‍ය හිමිකරු

- ජනමාධ්‍ය ආයතනයක හිමිකාරිත්වය ප්‍රධාන වශයෙන් කොටස් 02 කි.
- එනම් රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය හිමිකම ලෙසිනි.
- පුවත්පත් මාධ්‍ය කර්තෘ හිමි පුවත්පත්, මහජන සංවිධාන මගින් සහ පෞද්ගලික ව්‍යාපාර හිමි පුවත්පත් සහ දේශපාලන පක්ෂ හිමි පුවත්පත් මෙන්ම රජයට හිමි පුවත්පත් ආදී වශයෙන් විවිධ ස්වරූප වේ.
- ගුවන්විදුලි මාධ්‍ය හිමිකාරිත්වයද එලෙස ආකාර 03කින් වර්ග කිරීමට පුළුවන. එනම්, රාජ්‍ය හිමිකම සහිත ගුවන්විදුලි සේවා මහජන සංවිධාන හිමිකම සහිත ගුවන්විදුලි සේවා, පෞද්ගලික ව්‍යාපාර හිමිකම සහිත ගුවන්විදුලි සේවා මෙම ගුවන්විදුලි සේවා හිමිකමෙහි ප්‍රභේද වේ.
- රූපවාහිනී මාධ්‍ය හිමිකම මුල් අවධියේ දී පෞද්ගලික හිමිකම යටතේ ආරම්භ වුව ද වර්තමානය වන විට රාජ්‍ය හා පෞද්ගලික වශයෙන් එය පැහැදිලිව ප්‍රභේද දෙකකි.
- ජනමාධ්‍ය ආයතනයක් තුළ හිමිකම නිරූපණය වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලය තුළිනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් හා සභාපති ලෙස පත්වන්නේ හිමිකරුවන් හෝ හිමිකරුවන්ගේ නියෝජිතයන් ය.
- තම ජනමාධ්‍ය ආයතනයේ ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි.
- ජනමාධ්‍ය ව්‍යාපාරයක හිමිකරුවන් බොහෝ විට එහි ප්‍රතිපත්ති මහජන හිතකාමීව වඩාත් පුළුල් ආකාරයෙන් පවත්වා ගෙන යන අතර විටෙක නිදහස්ව තම කටයුතු පවත්වා ගෙන යනු ලබයි.

(ආ) මාධ්‍යවේදියා

- ග්‍රාහකයා වෙත ළඟා වෙන්නේ මාධ්‍යවේදීන්ය.
- මාධ්‍යවේදීන් ප්‍රධාන වර්ග දෙකකි. එනම්, ආයතනයට සම්බන්ධ මාධ්‍යවේදීන් හා නිදහස් මාධ්‍යවේදීන් වේ.
- සෑම ජනමාධ්‍ය ආයතනයකම තම ස්ථිර කාර්ය මණ්ඩලය තුළ මාධ්‍යවේදීන් යොදා ගැනීම සිදු වේ.

- එහිදී තෝරා ගන්නේ තමන්ගේ මාධ්‍ය ආයතනයේ ප්‍රතිපත්තිය පිළිගන්නා මාධ්‍යවේදීන්ය. එලෙස තෝරා ගන්නා මාධ්‍යවේදීන් තම ආයතනයේ ප්‍රතිපත්තිවලට අනුව හැඩගස්වා ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාව මාධ්‍ය ආයතනයේ අභිවෘද්ධිය සඳහා යොදා ගනී.
- මේ අනුව මාධ්‍ය ආයතනයකට සම්බන්ධ මාධ්‍ය ශ්‍රමිකයින් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම්, මාණ්ඩලික මාධ්‍යවේදීන් හා ප්‍රාදේශීය මාධවේදීන් වේ. මාණ්ඩලික මාධ්‍යවේදීන් වෘත්තීය මාධ්‍යවේදීන් ලෙස සැලකේ. ඔවුහු එම මාධ්‍ය ආයතනයේ මාසික වැටුප් ලබන මාධ්‍ය ශ්‍රමිකයින් වේ.
- ප්‍රාදේශීය මාධ්‍යවේදීන් යන අර්ධ කාලීන වශයෙන් යම් මාධ්‍ය ආයතනයකට තම සේවාව සපයන එම මාධ්‍ය ආයතනය සමග ගිවිසුම් ගතව සිටින තමන් කරන සේවාව වෙනුවෙන් පමණක් ගෙවීම් ලබන ශ්‍රමිකයින්ය.
- ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙනත් රැකියාවක් කරන අතර හෝ වෙනත් රැකියාවක් කරමින් සිට විශ්‍රාම ගෙන හෝ මාධ්‍ය ශ්‍රමිකයින් ලෙස බැඳී කටයුතු කරන්නෝය.
- මාණ්ඩලික මාධ්‍යවේදීන්ට වැටුපට අමතරව වෙනත් සේවා පහසුකම්ද, වරප්‍රසාද, උසස්වීම් ද හිමිය. ප්‍රාදේශීය වාර්තාකරුවෙකුට වුවද කලක් සේවය කිරීමෙන් පසු මාණ්ඩලික මාධ්‍යවේදියෙකු බවට පත්විය හැකිය.
- ප්‍රාදේශීය වාර්තාකරුවන් යම් බල ප්‍රදේශයක තොරතුරු වාර්තා කිරීමට යොදවනු ලැබේ. සපයන තොරතුරු අනුව වාර්තාව පළවන හෝ විකාශය වන ආකාරය අනුව ඔවුන්ට ගෙවීම් කරනු ලැබේ.
- කිසියම් ජනමාධ්‍ය ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම ආයතනයේ ප්‍රතිපත්තිය තීරණය කරනු ලබන අතර එය ක්‍රියාත්මක කරනු ලබන්නේ මාධ්‍යවේදීන් විසිනි. එහිදී එක් එක් ජනමාධ්‍ය ආයතනයේ කටයුතු යොමුවන දිශාව පිළිබඳව මාධ්‍යවේදීන් එකඟ වන අතර එය ක්‍රියාත්මක කරනු ලබන්නේ අවශේෂ මාධ්‍යවේදීන් විසිනි. මින් පැහැදිලි වන්නේ මාධ්‍ය ශ්‍රමිකයා හා මාධ්‍යවේදියා යනු මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ අභිප්‍රාය ග්‍රාහකයා වෙත ගෙන යන අතරමැදි නිර්මාණශීලී පුද්ගලයෙකු බවයි.

(ඇ) ග්‍රාහකයා

- ග්‍රාහකයා යනු මාධ්‍යවේදීන් විසින් ඉදිරිපත් කරනු ලබන විවිධ සන්දේශ අත්පත් කරගන්නා පුද්ගලයින් වේ.
- ග්‍රාහකයා වෙත ළඟාවීම සිදු කරනු ලබන්නේ මාධ්‍යවේදීන්ය.
- ග්‍රාහකයා භාවිත කරන පුවත්පත, ගුවන්විදුලිය හෝ රූපවාහිනිය වැනි ජනමාධ්‍ය මගින් ග්‍රාහකයා වෙත ලබාදෙන ප්‍රවෘත්ති හෝ වෙනත් විශේෂාංග ඉදිරිපත් කරනු ලබන්නේ මාධ්‍යවේදීන් විසිනි.
- ග්‍රාහකයාට මාධ්‍යවේදීන් ඉදිරිපත් කරන මාධ්‍ය ආකෘතිවල සැබෑ අර්ථය ග්‍රහණය කර ගැනීමට හැකියාවක් තිබිය යුතුය.
- ග්‍රාහක පිරිස වැඩි කර ගැනීමට මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන් සමත් විය යුතුය. එසේ නොවුනහොත් මාධ්‍යයට පැවැත්මක් නැත. මේ ග්‍රාහක පිරිස වැඩිහිටි, තරුණ, බාල මහලු, ගැහැණු හා පිරිමි ආදී වශයෙන් වර්ග කර ගත හැකිය. එසේම නාගරික හා ග්‍රාමීය හෝ ඉහළ පාන්තික මධ්‍යම පාන්තික හා පහළ පාන්තික වශයෙන් වර්ග කර ගත හැකිය.
- ග්‍රාහකයා බුද්ධිමත් නම් මාධ්‍ය හා වැඩසටහන් තෝරා ගෙන පරිහරණය කරන්නේ නම් කිසිදු මාධ්‍යයකට ග්‍රාහක මතය ඉක්මවා යා නොහැකිය.

**(තේමා තුනම පිළිබඳව පැහැදිලි කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)**

(ලකුණු 03)

(iv) ජනමාධ්‍ය ක්ෂේත්‍රය සඳහා රජය මගින් සිදු කරනු ලබන සෘජු මැදිහත්වීමක් සහ වක්‍ර මැදිහත්වීමක් පැහැදිලි කරන්න.

සෘජු මැදිහත්වීම

- ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා සඳහා බලපත්‍ර ලබාදීම ක්‍රියාත්මක කිරීමට අදාළ කොන්දේසි නියමයන් පැනවීම හා ඒ අනුව කටයුතු නොකිරීම මත අවවාද කිරීම, උපදෙස් දීම හෝ සේවාවන් අත්හිටුවීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය ලබාදී ඇති ආකාරයට විශේෂ අවස්ථා, හදිසි අවස්ථා, රටේ සාමය කඩවීම, අරගල ඇතිවීම වැළැක්වීම හා ත්‍රස්තවාදය වැළැක්වීම වැනි අවස්ථාවලදී සියලු ජනමාධ්‍යවේදීන්ගේ ප්‍රවෘත්ති හා සන්දේශ පාලනය කිරීම
- ජාතික ආරක්ෂාවට හානිකර ලෙස කටයුතු කරන විටෙක, ජනමාධ්‍ය ආයතනයක් රජයට පවරා ගැනීම තාවකාලිකව තහනම් කිරීම හෝ මුද්‍රා තැබීම
- යම් යම් නියමයන් යටතේ බදු පැනවීම
- මාධ්‍යවේදීන් පත් කිරීම හා පරිපාලනය සම්බන්ධයෙන් රජය සතු බලතල අනුව ක්‍රියා කිරීම
- අවශ අවස්ථාවන්හිදී නිසි බලධාරීන් පත් කිරීම
- විකාශන අයිතිය සඳහා අවසර ලබාගැනීම

වක්‍ර මැදිහත්වීම

- මාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් ප්‍රකාශයට පත් කිරීම
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් ජනමාධ්‍යයට එරෙහි මහජන පැමිණිලි භාරගැනීම හා විභාග කිරීම මෙන්ම තීන්දු ලබාදීම
- මාධ්‍යවේදීන්ට විශේෂ පහසුකම් ලබාදීම මගින්, මාධ්‍යවේදීන් රජයට හිතකර මානසික තත්ත්වයකින් ක්‍රියා කිරීමට සැලැස්වීම
- බදු පැනවීම
- මාධ්‍ය උපකරණවල මිල උච්චාවචනය වීම

**(උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)**

**(ලකුණු 04)**